ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

10835

පෙරහුරු පරීක්ෂණය - 2025

11 ශ්‍රේණිය	සිංහල භාෂාව හා සාහිත්‍යය -I	කාලය : පැය 01 යි.

සැලකිය යුතුයි :

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
- අංක **01** සිට **40** තෙක් ප්‍රශ්නවල දී දී ඇති **(1), (2), (3), (4)** උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- ඔබට සපයන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ **(X)** ලකුණ යොදන්න.

- **අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවලට එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.**

01. ඔහු <u>කටු අත්තක්</u> බව බොහෝ දෙනා පවසති.
(1) නිතර පරුෂ වචන කියන්නෙක් (2) නිතර දබර කරන අයෙක්
(3) අන්‍යයන්ට බාධා කරන්නෙක් (4) දැඩි තෘෂ්ණාවෙන් කටයුතු කරන්නෙක්

02. බෞද්ධාගම ජන ජීවිතයට <u>කැලෑ නීතිය</u> සෘජුව බලපෑවේය.
(1) නීතිය ක්‍රියාත්මක නොවීම (2) සම්පත් බෙදී යාමේ විෂමතාව
(3) බලවතා දුබලයාව පෙළීම (4) දිළිඳුකම තදින් ක්‍රියාත්මක වීම.

03. නව යෝජනාවට ඔවුහු <u>එක පයින්</u> කැමති වූහ.
(1) සම්පූර්ණ කැමැත්තෙන් (2) තනි කකුලෙන් සිටගෙන
(3) ප්‍රථමයෙන් ම (4) ඉතා ප්‍රීතියෙන්

- **අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

04. භාෂාවේ ඇතැම් වචන හා යෙදුම් දීර්ඝකාලීනව ව්‍යවහාර වීම නිසා ..... ඉක්මවන අමුතු අර්ථ ඒවාට ආරෝපණය වෙයි.
(1) ව්‍යංග්‍යාර්ථ (2) ධ්වනිතාර්ථ (3) කෝෂාර්ථ (4) වාච්‍යාර්ථ

05. සාහිත්‍ය නිර්මාණයක සාර්ථක අසාර්ථක බව මැනිය හැක්කේ ..... සිට එය විචාරය කිරීමෙනි.
(1) දූරස්ථව (2) මධ්‍යස්ථව (3) දිගුකාලීනව (4) අපක්ෂපාතීව

06. කිසියම් ඡේදයක අන්තර්ගත වැදගත් කරුණු ..... ඉදිරිපත් කිරීම සාරාංශකරණය වේ.
(1) සම්පිණ්ඩනය කර දැක්වීම. (2) සංයෝග කර දැක්වීම.
(3) සංක්ෂිප්ත කර දැක්වීම. (4) විස්තර කර දැක්වීම.

07. සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) සාමර්ථ්‍යය, අවස්ථෝචිත, ගෘහස්ථ, දූරකථනය
(2) උච්චාරණය, කුරුළු කූඩුව, විමර්ෂණය, ව්‍යංග්‍යාර්ථ
(3) විද්‍යාමාන, මර්දනය, විරෝධාර, ශ්‍රේෂ්ඨය
(4) ඓතිහාසික, කණිෂ්ඨ, විශිෂ්ට, සූර්යයා

PDF Scanner ACE Scanner

08. රූසියාව, වේදනාව, රූපවාහිනී, කෘෂියා යන වචනවල පළමු අකුරේ අඩංගු 'පිල්ලම්' අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) ඇදය, කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, දික් ඇදය, ගැට ඇලපිල්ල
(2) ඇලපිල්ල, කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, දික් ඇදය, ගැට ඇලපිල්ල
(3) පාපිල්ල, කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, ඇදය, ගැට ඇලපිල්ල
(4) පාපිල්ල, කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය, දීර්ඝ පාපිල්ල, ගැට ඇලපිල්ල

09. 'දක්ෂ' යන පදයෙහි අන්තර්ගත අක්ෂර වර්ග වනුයේ,
(1) ඕෂ්ඨ්‍ය, දන්තජ, මූර්ධජ (2) දන්තජ, කණ්ඨ්‍ය, මූර්ධජ
(3) කණ්ඨ්‍ය, මූර්ධජ, දන්තජ (4) දන්තජ, මූර්ධජ, කණ්ඨ්‍ය

10. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද ජේළිය තෝරන්න.
(1) විනිශ්චය, නිරීක්ෂණ, නීක්ෂණ, රක්ෂණ
(2) මිනිසෙක්, ළමයෙක්, කෝපය, කෞතුක
(3) කෝසල, මගධ, කුරු, පංචාල
(4) උද්දාමය, ප්‍රීතිය, දොම්නස, සොම්නස

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) රියදුරා, ගුරුවරුන්, තොප, ඔවුන්
(2) මිනිසෙක්, ළමයෙක්, වෙළෙන්දෙක්, ගිරවෙක්
(3) අප, ඔවුන්, තෝ, ගොවියෙක්
(4) මගින්, හෙදියක්, නුඹ, කම්කරුවන්

12. 'විදුහල්පතිතුමා විසින් පන්ති භාර ගුරුවරු කැඳවන ලදහ.' යන වාක්‍යයේ 'විදුහල්පතිතුමා' යන්නෙහි විභක්තිය කුමක් ද?
(1) ප්‍රථමා (2) කර්ම (3) සම්බන්ධ (4) කර්තෘ

13. 'දසබල' යන්න අයත්වන සමාසය කුමක් ද?
(1) දකාරාර්ථ සමාසය (2) විශේෂණ සමාසය
(3) අන්‍යාර්ථ සමාසය (4) විභක්ති සමාසය

14. 'ප්‍රත්‍ය + අර්ථ' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සකස් වන පදය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
(1) ප්‍රත්‍යයාර්ථ (2) ප්‍රත්‍යාර්ථ (3) ප්‍රතයයාර්ථ (4) ප්‍රත්‍යර්ථ

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.
(1) අසම්භාව්‍ය ක්‍රියා ⟶ කරත, බලද්දී, උන්සඳ, විමසද්දී
(2) කෘදන්ත ⟶ රැහුමන්, කියවිලි, නැටීම්, කියමන්
(3) සන්ධි ⟶ යථෝචිත, ගුණාගුණ, වනෝද්‍යානය, කුසලාකුසල
(4) සමාස ⟶ ඉරහඳ, දුකසැප, ණයතුරුස්, මල්පහන්

16. විධික්‍රියාවක් යෙදී ඇති වාක්‍යය තෝරන්න.
(1) වියතුන් විසින් දේශිත ප්‍රකාශ අසා අපි මවිත වූවෙමු.
(2) ඒ නිවේදනයට ඔබේ සවන් යොමු කරන්න.
(3) සිසුහු පාඩම් කර අත්‍යවශ්‍ය කරුණු සටහන් කර ගත්හ.
(4) දෙමව්පියන් විදේශගත වෙද්දී දරුවෝ හුදෙකලාව දිවි ගෙවති.

• අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරින්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

17. ගුත්තිල පඩිදුන්ගේ **හස්තිකාන්ත** වීණා නාදය කාගේත් පැසසුමට ලක් විය.
(1) සිත් ඇදගන්නා සුලු (2) ඇතුන් වසඟ කරන
(3) කන් පිනවන (4) ඇතුන් කුපිත කරවන

18. නාලාගිරි හස්තියා ඉදිරියට දිව එද්දී එක් **මාගමක** දුටුවේය.
(1) කාන්තාවක (2) කුඩා ගමක්
(3) දරුණු සතෙක් (4) මායාකාර ගැහැනියක්

19. භාෂාව හා සංස්කෘතිය අතර ඇත්තේ **අවියෝජනීය** සබඳතාවකි.
(1) වෙන් කළ නොහැකි (2) එකට එකතු වූ
(3) එකට මිශ්‍ර වූ (4) ඉතා සමීප

20. දී ඇති වචන ගොනු අතරින් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයක් සමඟ බැඳී **නොපවත්නා** පද ජේළිය ඇතුළත් වරණය තෝරන්න.
(1) පොත්, සඟරා, පුවත්පත්, රූපවාහිනී
(2) පිඟිය, කැත්ත, කතුර, කඩුව
(3) අඹ, දුරු, ඉඟුරු, සූදුරු
(4) සාරිය, ගවුම, කලිසම, කමිසය

21. එක් එක් පද ජේළියේ දක්වා ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) සුදු = ධවල, හද = හෘදය, නුඹ = පොළොව, සිසි = සූර්යයා
(2) මව = දිනිති, අරවින්ද = නෙලුම්, තොල් = ඕෂ්ඨ, සතුරු = පිළිමල්
(3) පොළොව = ගගන, නුවණ = ඇස, දණ = ජනතාව, අක්ෂි = ඇස්
(4) දොරටුව = ද්වාරය, නිවස = කැදැල්ල, පිරිසිදු = නිර්මල, කාන්තාව = මව

22. මුලින් දී ඇති පදයට **සාමානාර්ථයක්** නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ධරණි = මහී, වසුන්ධරා, මිහි, දෙරණ
(2) පොත = ග්‍රන්ථය, පුස්තකය, ගත, පුවත්පත
(3) ජලය = අඹ, දිය, වතුර, පැන්
(4) අක්ෂි = නෙත්, නේත්‍ර, නයන, ඇස්

23. **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
(1) උස - මිටි (2) කන - බොන (3) යන - එන (4) රට - නොට

24. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) 'සොයන' යනු කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවකි.
(2) 'බැලීම' යනු කරණකාරක කෘදන්තයකි.
(3) 'ස්වර්ණමය' යනු එයින් කරන ලද යන අරුත දෙන්නකි.
(4) නූතන සිංහල වර්ණමාලාවේ අන්තර්ගත මූළු ව්‍යඤ්ජන අක්ෂර ගණන 60 කි.

25. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍ය තෝරන්න.
(1) ජල සංරක්ෂණය සඳහා විධිමත් ක්‍රියා පටිපාටියක් අනුගමනය කළ යුතු ය.
(2) ඔහුගේ මතය තර්කානුකූල ව පිළිගත නොහැකි ය.
(3) ආරාධිත අමුත්තාට සිදු කළ දේශනය මව්සින් පවත්වන්නට යෙදිණි.
(4) දේශනයට සාවධාන ව සවන් දීමෙන් එහි අන්තර්ගතය පහසුවෙන් ම අවබෝධ වන්නට විය.

ACE Scanner
PDF Scanner

• අංක 26, 27 ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

26. ඕනෑම ක්‍රියාවකට යම් ප්‍රතික්‍රියාවක් ද ඇති බව,
(1) එලොව ගිහින් මෙලොව ආවා වගෙයි.
(2) ඔංචිල්ලාව එහාට ගියත් මෙහාට එනවලු.
(3) පරංගියා කෝට්ටේ ගියා වගෙයි.
(4) අත දීලා දත නියවනවා වගෙයි.

27. පිළිකුලෙන් හෝ නොසැලකිල්ලෙන් සැලකීම.
(1) උගෙන් කවද ද කහ නැවේ.
(2) මඩේ හිටවපු ඉන්න වගෙයි.
(3) ලෙඩ කපුටෝ වැල කනවා වගෙයි.
(4) එපා වාහෙට හොඳි බෙදනවා වගෙයි.

28. ආගම සන්ධියට හා ද්විත්වරූප සන්ධියට අයත් පද පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) සල්ලන්න, ඇද්දළ
(2) වියවුල්, කොල්ලා
(3) සිහිනිඟ, පුනරුදය
(4) කටුවල, පාපොච්චාරණය

• අංක 29, 30 යටතේ දක්වා ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

29. (1) සිසුනු බොහෝ දෙනෙක් විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබූහ.
(2) ඔවුනු තුමූ පුදබිමට යන්නේ ය.
(3) රියදුරෝ මාර්ග නීති පිළිපැදිය යුතුය.
(4) අපි පෝෂ්‍යදායී ආහාරවලට හුරු වන්නේ කවදා ද?

30. (1) විදුහල්පතිතුමා නොහොත් විදුහල්පතිතුමිය සභාව අමතන්නේ ය.
(2) දරුවන් යහමහ යනී'යි දෙමව්පියෝ සිතති.
(3) සිසුන් සමඟ ගුරුවරුන් ද සිනමා ශාලාවට ගියහ.
(4) වෛද්‍යවරු සේවයට වාර්තා කර නැත.

31. සුනේත්‍රා, ඉන්සරණ, කාව්‍යශේඛරය කෘතිවල රචකයන් පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?
(1) ඩබ්.ඒ.සිල්වා, රාහුල හිමි, විද්‍යාචක්‍රවර්ති,
(2) රාහුල හිමි, විද්‍යාචක්‍රවර්ති, ඩබ්.ඒ.සිල්වා
(3) විද්‍යාචක්‍රවර්ති, ඩබ්.ඒ.සිල්වා, රාහුල හිමි
(4) ඩබ්.ඒ.සිල්වා, විද්‍යාචක්‍රවර්ති, රාහුල හිමි

32. පහත දැක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
මොරසුරන වරුසා ඇදහැලෙන කොට සප්පන්ට බුදියගත්නැකි
(1) වරුසාව ඇදහැලෙන මොහොතේ නිදාගත යුතුය.
(2) වැසි වැස්සොත් හොඳින් නිදාගන්න පුළුවන්ය.
(3) තදට වැසි වසිද්දී සැපට නිදාගත හැකිය.
(4) තදට ම වැසි වැස්සොත් සැපට නිදාගත හැකිද?

33. 'සිසිවන වුවන ඉහ සුහ ගත හැකි මිටින' මෙයින් ඉස්මතු වන්නේ,
(1) උපමාවකි.
(2) ව්‍යංගාර්ථයකි.
(3) අතිශයෝක්තියකි.
(4) රූපකයකි.

34. පෙරදිග ගොරහැඩි රකුසෝ,
මගේ ධ්‍යානය ඇයි කඩන්නේ ..... මෙම පද්‍ය පංතියේ රචකයා වන්නේ,
(1) කුමාරතුංග මුණිදාස
(2) ජී.බී.සේනානායක
(3) සිරි ගුණසිංහ
(4) මහගමසේකර

35. එල්ලංගාව, කුරුවේ රාජකාරිය, පැල් ගැහීම, මඩම් යන පද සඳහා පොදු වහර නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?
(1) බැවුම, අලි ඇල්ලීම, විවාහ වීම, විශ්‍රාම ශාලා
(2) අලවංගුව, රාජ්‍ය සේවය, පැල් රැකීම, අනාථ නිවාස
(3) එල්ලීම, පොදු වැඩ, පැල් නැනීම, ආපන ශාලා
(4) එළිමහන, ගෙදර වැඩ, එකතු වීම, අම්බලම

36. පහත සඳහන් කවියේ දෙවන පදය තෝරන්න.
සපෙක් එකෙකු කැව නසිනේ ඔහු ම වද
.....
පඟක් දුදන පලු කන මුව ළං කළ ද
වඟක් නැසෙයි වැනසෙයි එමතු ද ඔහු ද
(1) වර සුරපුරෙහි වත් නොපවති නිරයේ ලෙද
(2) ගොරතර නිරෙහි වත් පරහට වැඩ ඇති ද
(3) සුරපුර ලෙසට සලකා හැසිරෙත් නිබ ද
(4) අනෙක් ලොවින් නොනැසෙයි සතෙකුත් එකද

37. වෙහෙල් කැලැ, මෙරමා යන වචනවල අර්ථ අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) විශාල කැලෑ, පිටුවහල් කිරීම
(2) මුව සමූහය, අනන්‍යයන්
(3) මොනර සමූහයා , හිතවතුන්
(4) කුරුලු රංචුව, විරුද්ධවාදීන්

38. හේන් භාෂාවේ 'අලියන් වෙලාව' යනුවෙන් හැඳින්වුයේ,
(1) අලි යන වේලාවය.
(2) අදුර වැටෙන වේලාව
(3) උදැසන වේලාවය.
(4) රාත්‍රී කාලය ය.

39. "ඔව් වොව්, වොව් කන්ඩ. ඔක්කොටම කන්ඩ..... නෝනේ අනේ නෝනේ, සිං අයිති වෙයි, ඔතනිං බහින්ඩ. ඔහොමම ඉංඩ බෑ....."
මෙම පාඨය අයත් කෘතිය වන්නේ,
(1) හෙයියම්මාරුව
(2) වඩබාගින්න
(3) සුන්නද්දුලි
(4) කරුමක්කාරයෝ

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.
දුම්පානය ශරීර සෞඛ්‍යයට බෙහෙවින් අහිතකර වන අතර අප රටේ බලවත් ප්‍රශ්නයක් ව පවතින සුරාව හා මත්ද්‍රව්‍ය භාවිතයට විරුද්ධව ද දැඩි මහජන මතයක් ඇති කළ යුතුය.
(1) දුම්පානය මෙන් ම මත්ද්‍රව්‍ය භාවිතය ද ශරීර සෞඛ්‍යයට අහිතකර නිසා එය මැඩ පැවැත්වීමට මහජන මතයක් ඇති කළ යුතුය.
(2) ජනතාවගේ සෞඛ්‍යය තක්ත්වය බිඳ හෙළීමේ ලා දුම්පානය මෙන්ම මත්ද්‍රව්‍ය ද බලපාන්නේ ය.
(3) අපේ රටේ ප්‍රමුඛත්වය දිය යුත්තේ දුම් ඉවීමට එරෙහි වීමට සහ සුරා හා මත්ද්‍රව්‍ය භාවිතයට විරුද්ධව කරන කටයුතු වලට ය.
(4) සුරාව, මත්ද්‍රව්‍ය භාවිතය ආදී සෞඛ්‍යය හා සමාජ විරෝධී කටයුතු මැඩලීම සඳහා මහජන මතයක් ඇති කිරීම අවශ්‍ය වේ.

ACE Scanner
PDF Scanner

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

පෙරහුරු පරීක්ෂණය - 2025

11 ශ්‍රේණිය	සිංහල භාෂාව හා සාහිත්‍යය - III	කාලය : පැය 02 යි.

10900

(1). (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස් වලට කෙටි උත්තර ලියන්න. කිසියම් කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) සුන් එනතින් එනඳ
පසුකර සුරන් වෙණ නඳ
.....
.....

(අ) මෙහි ඊළඟ කවි පේළි දෙක ලියා කවිය සම්පූර්ණ කරන්න.
(ආ) මෙම කවියෙන් ඉස්මතු වන කාව්‍යාලංකාරය කුමක් ද?

(ii) මිතුරු කමින් පෙරට එතොත්
දුවිල්ලක් එක්ක වුණත්
මිතුරුවෙයන් පුතේ නුඹත්
එයයි ලොවේ ගුණය මහත්

(අ) මෙහි සංකේත දනවන වදන කුමක්ද?
(ආ) මෙහි දක්වා ඇති පරිදි ලෝකයේ දක්නට ලැබෙන මහත් ගුණාංගයක් ලියන්න.

(iii) "ඇයි අනේ, මම හිතුවා ඔයා ඕකට සතුටු වෙයි කියලා"
(අ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කා හට ප්‍රකාශ කරන ලද්දක් ද?
(ආ) "ඕකට" යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(iv) සබඳ, තොප විසින් කුමක් දක්නා ලද්දේ ද? කුමක් අසන ලද්දේ ද?
(අ) මෙම කොටස අයත් පාඩම උපුටා ගත් මුල් කෘතිය කුමක් ද?
(ආ) මෙහි 'සබඳ' යනුවෙන් ඇමතුවේ කාට ද?

(v) "මේ හැම මා අරභයා කියවූ ද?"
(අ) මෙම ප්‍රකාශනය අයත් පාඩම උපුටා ගත් මුල් කෘතිය හා එය රචිත යුගය දක්වන්න.
(ආ) මේ කියන පුද්ගලයා අරභයා ප්‍රකාශ කළේ යැයි පවසන කියමන් මොනවාද?

(vi) සැහවෙමි එබෙමි නිසසල වෙමි සසල වෙමි
ඇඹරෙමි එහෙත් පසු නොබසිමි නොනවතිමි
කවදා කොතැනක දී හෝ මහමුහුද හිමි
හමුවුණ කෙණෙහි මා සතු බර ඔහුට දෙමි

(අ) මෙම පද්‍ය පන්තියෙහි රචකයා හඳුන්වන අන්වර්ථ නාමය කුමක් ද?
(ආ) "මුහුද හිමි" යන්න අයත් කාව්‍යාලංකාරය නම් කරන්න.

PDF Scanner ACE Scanner

(vii) ඇස නැනිදා පොත ගත්තේ කියන්ට ද
දත නැනිදා උක්දඬු ගිනි තපින්ට ද
වෙර නැති දා ගඟගත්තේ දිනන්ට ද
යුධ ඇති දා නැති කග කොස් කෑටන්ට ද

(අ) මෙම කවිය ජනකවියේ කිනම් ප්‍රභේදයකට අයත් ජන කවියක් ද?
(ආ) වෙර, කග යන වචනවල අර්ථය ලියන්න.

(viii) "නොබව මහරජ නොබව මහරජ මේ දැන් කිහිඹියකුදු
දිවි නො ගළවයි. මුහු කෙරෙන තට භය නැති"

(අ) මෙම කවිය ජනකවියේ කිනම් ප්‍රභේදයකට අයත් ජන කවියක් ද?
(ආ) වෙර, කග යන වචනවල අර්ථ ලියන්න.

(ix) තුමුල ගතින්දා
බාහු බෙලෙන්දා
වෙමි සේ නිදසින් දා
කුරිරු ගිසින්දා කුඹුනල සින්දා
ලමි සේ කෙසරින්දා

(අ) තුමුල, නිදසින්දා යන වචනවල අර්ථ ලියන්න.
(ආ) මෙම කොටස අයත් පාඩම උපුටාගත් කෘතියේ රචකයා විසින් රචිත නවකතා 2 ක් ලියන්න.

(x) කුඹුක් අතු වතුර අත ගඟ නාමිලා දියට
දිය කෙළින හැටි පුංචි මාළුවෝ දුටුවා ද
පුරපසේ සඳ එක්ක තරහයට මෝරන්ට
හුලන්දා ඔය කිම් ද මල්වරව ඉල්මහට

(අ) මෙම පද්‍ය පන්තියේ රචකයා කවුද?
(ආ) මෙහි රචකයාගේ මුල්ම කාව්‍ය සංග්‍රහය කුමක් ද?

(2). පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) රුහි වනපෙතිනැවිදින් සුමුවෝයා
නිති මියුරුති වෙණ නදළමුවෝයා
සිතුවිලි නැති රූ විලස මුවෝයා
නැති නොගනිති මිනිසුන් සමුවෝයා

(අ) සුමුවෝයා, නදළමුවෝයා යන වචනවල අර්ථ ලියන්න.
(ආ) වෙණ නද ඇසීමට පැමිණි මුවන් සිටි ආකාරය දක්වා ඇත්තේ කෙසේද?

(ii) මේ මහට පුරුෂයො දස දෙන දු විසි නිස් හතළිස් පනස් දෙන දු සැක ඇතිව වග වග වැ එති. ඔහුදු මා අතැ නස්සී. එතෙකුදු හොත් මේ මහණ එකලා වැ මා අභිභවමින් මෙන් එයි.

(අ) වග වග වැ, එකලා වැ යන පදවල අරුත් ලියන්න.
(ආ) බුදුන් වහන්සේ දුටු විට අංගුලිමාල සිතූ දේ කෙටියෙන් විස්තර කර ලියන්න.

(iii) කුළින් කුළම සිහිල්ඔ වැහෙන කඳුරුය
දොළින් දොළම කල් යල් කෙරෙන කුඹුරුය
පළින් පළම තල් පොල් ගෙවතු මැදුරුය
තළින් තළම පුල් පියුමුපුල පඬෙරුය

(අ) සිහිලඔ පඬෙරු යන පදවල අරුත් ලියන්න.
(ආ) කවියේ සඳහන් පරිදි පාරිසරික සුන්දරත්වය වර්ණනා කර ඇති අයුරු කෙටියෙන් ලියන්න.

(iv) "පුන, තෙල ලෙස කිරීම නොපටන්, අපටත් තරම් නොවෙයි. තරම් තැනකින් සරණක් ගෙනවුත් පාවා දෙමහ"

(අ) තෙල, තරම් යන පදවල අර්ථ ලියන්න.
(ආ) මෙහි දැක්වෙන ආකාරයට දෙමව්පියන් සිටු පුත්‍රයාට කළ ප්‍රකාශනය ලිහිල් බසින් ලියන්න.

(v) "කොල, පව්වූ දුෂ්ට අධර්මිෂ්ඨ වූ නිකෘෂ්ට අනාචාර ස්වරූප ඇති අවලක්ෂණ වූ අඥාන බමුණු මහල්ල, තෝ ධර්ම යුද්ධ කෙරෙමියි කියා ගොසින් තම මුණුබුරු තරමටත් නැති ඉතා බාල තැනැත්තන් වැද පිය."

(අ) නිකෘෂ්ට, අධර්මිෂ්ඨ යන පදවල අර්ථ දක්වන්න.
(ආ) කේවට්ට බමුණාට සිදු කළ මෙම දෝෂාරෝපණය සරල බසින් ලියන්න.

(ලකුණු 4 x 5 = 20)

(3). ජාතකකතාකරුවා විසින් උපයුක්ත

- භාෂා ශෛලියත්
- අවස්ථා හා සිද්ධි නිරූපණය කරමින් කතා වස්තුව ගොඩ නැඟීමත් යන සාධක නිසා පාඨක ආකර්ෂණය දිනා ගත හැකි ආකාරයට විකාශනය වනු දක්නට ලැබේ. "සතරකන් මන්ත්‍රණය" පාඩම ඇසුරින් පැහැදිලි කරන්න.

නැතහොත්

- විවිධ විරිත් භාවිත කිරීමත්
- කවියා සතු ප්‍රතිභාවක් මැනවින් උද්දීපනය වන නිසා ඉන්කිල කාව්‍ය රසවත් පද්‍ය කෘතියක් බවට පත්ව ඇත. නිදසුන් කුනක්වක් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි.)

(4). * දරුවන්ගේ රුචි අරුචිකම් මැනවින් ඉස්මතු කර පෙන්වීමටත්
* චරිත නිරූපණයට උචිත පරිදි බස හැසිරවීමටත් නාට්‍යකරුවා දක්වා ඇත්තේ සුවිශේෂී දක්ෂතාවකි. 'ලෙන අතහැරයාම' නාට්‍ය කොටස ඇසුරින් පැහැදිලි කරන්න.

නැතහොත්

- සජීවී අවස්ථා හා සිද්ධි ඉස්මතු කරමින් කතා පුවත විකාශනය කිරීමත්
- ගැමි සමාජ යථාර්ථය තත්වාකාරයෙන් ගෙන හැර පෑමට සමත් වී තිබීමත් නිසා ම 'අපට වැසිකිලියක්' කෙටිකතාව ඉතා සාර්ථක කෙටිකතාවක් ලෙස පාඨක ප්‍රසාදය දිනා ගැනීමට සමත් ව ඇත. එක් කරුණට නිදසුන් දෙක බැගින් ඇතුළත් වන සේ පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

PDF Scanner ACE Scanner

- 5, 6, 7 ප්‍රශ්නවලින් **එකකට පමණක්** උත්තර ලියන්න.

(5). අප සතුව පැවති ප්‍රෞඩ ඉතිහාසයත් අතීත ශ්‍රී විභූතියත් ගෙන හැර දක්වමින් සෞභාග්‍යවන්ත අනාගතයක අවශ්‍යතාව මතු කරන පද්‍ය පන්තියක් සේ "දැතේ කරගැට සිඹ සතසන්නට" පද්‍ය පංතිය ඇගයීමට ලක් කරන්න.

(6). විවිධ වූ අද්දැකීම් ලැබීමත් සමඟ පුද්ගල චර්යාදාමය ද විවිධත්වයක් පෙන්නුම් කරයි. 'දියමන්ති මාලය' කෙටි කතාව තුළින් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(7). කුරක්කන් වගාවේ දී ගොවියා මුහුණ දෙන අනේකවිධ දුක්ඛ දෝමනස්සයන් අභියෝගාත්මක ව ගෙන හැර පෑමට ගත් උත්සාහය "කුරහන් ඉසිමුව කළුවර බලාලා" පද්‍ය පංතිය තුළින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

PDF Scanner ACE Scanner

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

පෙරහුරු පරීක්ෂණය - 2025

11 ශ්‍රේණිය	සිංහල භාෂාව හා සාහිත්‍යය - II	කාලය : පැය 02 යි.

10958

(1). (i) සිට (x) තෙක් ඇති සියලු ම අනු කොටස් වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) සිංහල අක්ෂර මාලාවේ ඇතුළත්

(අ) අර්ධ අනුනාසික අක්ෂර 2 ක් ලියන්න.

(ආ) ට, ඨ, ණ, ඩ, ණ, ඩ, ර, ෂ, ළ යන අක්ෂර කාණ්ඩය හඳුන්වන නම කුමක් ද?

(ii) පහත සඳහන් වාක්‍යයේ අන්තර්ගත කෘදන්ත පද 2 ක් උපුටා ලියන්න.

පැරණි රජවරුන් පිළිබඳව ලියවුණු පොත්පත් වත්මන් සමාජයේ දරු පරපුරට, මෙන් ම වැඩිහිටියන්ට කැප වීමෙන් වැඩ කරන අයුරු ආදර්ශයෙන් පෙන්වන කදිම නිදර්ශන වන්නේ ය.

(iii) පහත සඳහන් පද විසන්ධි කරන්න.

(අ) රනෝවිලි (ආ) මිනිස්සු

(iv) පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාසය දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න. අතිවිශිෂ්ඨ ගායනයක යෙදුණු ඔහු කණිෂ්ඨ අංශය නියෝජිතය කරන අති දක්ෂ ශිෂ්‍යයෙකු බව විදුහල්පතිතුමා ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී ප්‍රකාශ කළේ ය.

(v) පහත සඳහන් පදවල සමාස වර්ගය ලියන්න.

(අ) තිනෙත් (ආ) හදවිල

(vi) පහත පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍යය නිවැරදි ව වෙන් කරන්න.

(අ) සිටාණෝ (ආ) කුමරා

(vii) පහත සඳහන් වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත පද යත් වන සන්ධි පද ප්‍රවර්ගය නම් කරන්න.

(අ) **දුප්පත්** මිනිසුන්ගේ ජන ජීවිතය දෙස පොහොසතුන්ගේ අවධානය යොමු විය යුතුය.

(ආ) ඔහු **මංමුලා** වූවෙකු සේ නිතර කටයුතු කරයි.

(viii) පහත සඳහන් වාක්‍යයේ අන්තර්ගත උපසර්ග පද 2 ක් ලියා දක්වන්න.

විභාගයේ පිළිතුරුපත් පරීක්ෂා කිරීමට පැමිණි කාගේත් අවධානය මුලින් ම යොමු වූයේ සුසිරිත් වඩවන ආගමික පිළිවෙත් සපුරන්නට ය.

(ix) පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) ඔවුහු සිනමා ශාලාවට පැමිණෙනි'යි කවුරුත් විශ්වාස කළහ.

(ආ) මම දක්ෂ ක්‍රීඩකයෙකු නොවෙමි.

(x) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(අ) ගොවිහු කෘමිසතුන් විනාශ කරයි.

(ආ) අපි නවකතා පොත් මිලදී ගත්තෙමු.

PDF Scanner ACE Scanner

(2). පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනාව සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) වත්මන් සමාජයේ කුඩා දරුවන්ගේ පටන් වැඩිහිටි බොහෝ පිරිස් සමාජ මාධ්‍ය ජාලාවලට පිවිස තොරතුරු හුවමාරු කර ගනු දක්නට ලැබේ. මේ අතර තම අභිවෘද්ධිය පිණිස ම සමාජ මාධ්‍ය ජාලා භාවිතය සිදු කරන්නන් අවම වෙටමක පවතින අතර බහුතරය පුරුදු වී සිටින්නේ සිය පරිභාණිය ඒ තුළින් ළඟා කර ගැනීමට ය. මේ පිළිබඳව කොතෙකුත් දැනුවත් කිරීම් සිදු කළ ද එහි වෙනසක් මේ වන විට ද දක්නට නොමැති වීම අභාග්‍යසම්පන්න සිදුවීමක් හෙයින් මෙහි වගකීම එක් පාර්ශවයක් වෙත පැවරීම සිදු නොවිය යුතු කාර්යයකි.

(ආ) රිය අනතුරුවලට ගොදුරු වී අකාලයේ මිලිනව යන ජීවිත සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යෑම බෙදනීය ඉරණමකි. ඒ තුළින් සමාජයට වටිනා පුද්ගලයන් අහිමි වීම රටක් වශයෙන් මුහුණ දීමට සිදුවන බරපතල සංසිද්ධියකි. වත්මනයේ දක්නට ලැබෙන මෙකී සාධනය නිසා බොහෝ පිරිස් විනෝද වාරිකා යෑමට පවා දක්වන්නේ ඉමහත් බියකි. මේ පිළිබඳව පාලක පන්තියේ ද අවධානය යොමු කිරීම කාලෝචිත ක්‍රියාමාර්ගයකි.

(ඉ) සරු පොළොවත් අප සතුව පැවතුණත් කෘෂිකාර්මික අවබෝධය දරුවන්ට මෙන් ම වැඩිහිටියන්ට ද ලබා දීමට කටයුතු යොදා නිබුණත් වගා කටයුතු සිදු කිරීමට ගොවි ජනතාව දක්වන්නේ මැළිකමකි. එයට ප්‍රධාන හේතුව වී ඇත්තේ සතුන්ගෙන් සිදුවන වගා හානි ශීඝ්‍රයෙන් ඉහළ ගොස් පැවතීමයි. මේ පිළිබඳව කලින් කලට ජනතාවගේ මැසිවිලි ජනමාධ්‍ය මඟින් ප්‍රකාශ කළත් මේ වන විට ද නිසි විසඳුම් නොමැති වීම ගොවි ජනතාව මුහුණ පා ඇති ප්‍රබල ගැටළුවකි.

(ඊ) දරුවන්ගේ පෞරුෂ සංවර්ධනයේ දී සදාචාර සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය. විශේෂයෙන් තාක්ෂණික මෙවලම් සමඟ දරුවන් නිරතුරුවම කාලය ගත කරන නිසා ඔවුන්ගේ සදාචාරාත්මක ගති පැවතුම් දූෂ්ඨ වී පවතී. දහම් පාසල් අධ්‍යාපනය ද අනිවාර්ය නොවීම ද පාසල් විෂය මාලාව තුළ ආගමික ඉගැන්වීම්වලට අඩු කාලච්ඡේද සංඛ්‍යාව යොදා තිබීම ද තවදුරටත් බලපාන සාධක වන්නේ ය. මේ පිළිබඳව ද බලධාරීන්ගේ අවධානය යොමු කිරීමේ කාලීන අවශ්‍යතාව උදා වී ඇත.

(ලකුණු 25)

(3). පහත දැක්වෙන පාඨය වචන 65 – 70 ත් අතර වන සේ සාරාංශ කරන්න. සාරාංශයේ අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

ඉගෙන ගැනීම නම් දැනුම අත්කර ගැනීමයි. ලබාගත් දැනුම සිතේ දරාගෙන ප්‍රයෝජනයට ගැනීම හා අවශ්‍ය අවස්ථාවන්හි දී එනම් ජීවිතයේ විවිධ අවස්ථාවල දී විවිධ කාරණා සඳහා සාර්ථකව යොදා ගැනීම හා ඉදිරිපත් කිරීම ද, ඒ පිළිබඳ අද්දැකීම් ජීවිතයට එකතු කර ගැනීම ද ඉගෙනීමේ ම කොටසකි. දැනුම ලබා ගැනීමට හා දැනුම රැස් කර ගැනීමට ස්මෘතිය වැදගත් වනු ඇත. ස්මෘතිය අභ්‍යන්තර ස්මෘතිය, පශ්චාත් ස්මෘතිය වශයෙන් විභාග කළ හැකිය. ප්‍රශ්නය ක්ෂණිකව දිය හැකි පිළිතුර අභ්‍යන්තර ස්මෘති පදනම් වූවකි. වඩා හොඳින් කල්පනා කර පසුව සකසා දිය හැකි පිළිතුර හෝ විසඳුම පශ්චාත් ස්මෘති වේ. ස්මෘතිය, එනම් මතක තබා ගැනීමේ ශක්තිය සහජයෙන් ගෙන එන්නකැයි ඇතමෙක් විශ්වාස කරති. ඒ නමුත් යම් යම් බාහිර සාධක මත තබා ගැනීමට ආධාරකාරී වන බව විවිධ අධ්‍යයනයන්ගෙන් සනාථ වී තිබේ.

සිත ඉගෙන ගැනීමට පමණක් නොව මිනිසාගේ සියලු ක්‍රියාකාරකම් සඳහා ප්‍රධාන වන්නේ ය. විශ්වය තුළ ඇති අභිගයින් විශ්මිත වූ ද තේරුම් ගැනීමට දුෂ්කර වූ ද වස්තුව මිනිස් සිතය. එනම් විඤ්ඤාණ ධාතුව වේ. සිත පාලනය කර ගැනීම සිත සන්සුන් කරගෙන එක අරමුණක පිහිටුවා ගැනීම එනම් සිතේ ඒකාග්‍රතාව භාවනාව යනුවෙන් හැඳින්වෙන හෙයින් සිත යනු කුමක් ද? එහි ස්වභාවය යනු කුමක් ද යන්න සලකා බැලීම විශේෂයෙන් වැදගත් වේ.

(ලකුණු 06)

(4). පහත දැක්වෙන පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ඇතමුන් දීර්ඝ කාලයක් එකට කමින් බොමින් විනෝද වෙමින් ඇසුරු කොට යම් හේතුවකින් අමනාප වී නම් අනතුරුව ඔහු විවේචනය කිරීම අප සමාජයේ දක්නට ලැබෙන සුලබ දෙයකි. බොහෝ දෙනෙකු මෙම ක්‍රමය අනුගමනය කරන්නේ කුහකකම නිසා මෙන් ම තමා නිවැරදි කෙනෙකු බව තහවුරු කිරීම සඳහා ය. එවැනි ගතිගුණ ඇති පුද්ගලයන් ද සමාජයේ සිටින බැවින් කේරුම් ගත යුත්තේ පුද්ගලයන් ඇසුරු කිරීමේ දී කල්පනාකාරීව ඇසුරු කළ යුතු බවයි. කොයි මොහොතක හෝ ඔවුන් අපෙන් ඇත් වීමට ඉඩ ඇති බැවින් ඇත් වූ පසුව අප වෙත චෝදනාවන් කිරීමට නොහැකි වන අයුරින් අන්‍යයන් ඇසුරු කළ යුතුය.

සැනසිලිදායි සාමකාමී අර්ථවත් ජීවිතයක් ගත කිරීම සඳහා කල්‍යාණ මිත්‍ර සම්පත්තිය අත්‍යවශ්‍ය ය. සත්පුරුෂ කල්‍යාණ මිත්‍ර සේවනය ඉතා දුර්ලභ සම්පත්තිය බව බුදු දහමේ සඳහන් වේ. යහපත් අර්ථවත් ජීවිතයක් ගත කිරීමට ප්‍රාර්ථනා කරන්නෙකු විසින් කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කළ යුතුය. සුදන ගුණ වලින් යුතු කලණ මිතුරන් නොමැති නම් හුදෙකලා ව සිටීම සුදුසු බව බෞද්ධ ඉගැන්වීමයි.

1. ඡේදයේ සඳහන් ආකාරයට පුද්ගලයන් අතින් සුලබ ව සිදුවන වරදක් ලෙස මෙහි දක්වා ඇත්තේ කුමක් ද?
2. කෙනෙක් නව කෙනෙකු ව විවේචනය කිරීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක් ද?
3. කෙනෙක් නව කෙනෙකු ඇසුරු කළ යුත්තේ කෙසේද?
4. කල්‍යාණ මිත්‍ර සම්පත්තිය අත්‍යවශ්‍ය වන්නේ ඇයි? කලණ මිතුරු ඇසුර පිළිබඳ බුදු දහමෙන් දෙන මඟ පෙන්වීම කුමක් ද?
5. ඔබගේ ප්‍රදේශයේ මෑත කාලීන ව සිදු වූ සුවිශේෂ යන්සිද්ධියක් පාදක කරගෙන පුවත්පත් වාර්තාවක් සකසන්න.

නැතහොත්

ඔබ "ශක්තිය" සුබසාධක සංගමයේ සභාපති යැයි සිතන්න. එය අංක 27, මල්වත්ත පාර, කුරුණෑගල යන ලිපිනය දරන ඔබගේ ප්‍රදේශයේ ක්‍රියාත්මක සක්‍රිය සමාගමකි. එහි අවශ්‍යතාවන් අනුව දම්රෝ පුටු 300 ක් මිලදී ගත යුතුව ඇතැයි සලකා ඒ පිළිබඳව තොරතුරු විමසමින් එම ප්‍රදේශයේ දම්රෝ වෙළඳ ආයතනයේ කළමනාකරුට යවන ව්‍යාපාරික ලිපිය සකසන්න.

(ලකුණු 15 යි)

PDF Scanner ACE Scanner